# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2091/11 - 2018 ඔක්තෝබර් මස 02 වැනි අඟහරුවාදා - 2018.10.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

පක්ෂ සාමාජිකත්වය අහෝසි වීම හේතුකොට ගෙන පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සභික ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ අංක 09, කඩියන්ලෙන කොට්ඨාසයට තේරී පත්වූ පේමසිරි බෝගහවත්ත අයත් වන්නා වූ ජනසෙත පෙරමුණ නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30)ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ අංක 09, කඩියන්ලෙන කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින්ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා නමඩගස්වැව සුගතසෝම හිමි නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින්ද ;

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී තලංගම අප්පුහාමිලාගේ චමින්ද නාමල් තලංගම වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් නමඩගස්වැව සුගතසෝම හිමි පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ අංක 09, කඩියන්ලෙන කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ටී. ඒ. සී. එන්. තලංගම,
තේරීම්භාර නිලධාරී,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 28 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මහනුවර.

10 - 625


1A - G 28620 — 17 (2018/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*